**නිවිතිගල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 17 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 09 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , නිවිතිගල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබද තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනට සභාව සතු ස්ථිර තැන්පත් ආයෝජන වටිනාකම රු 1,710,638 ක් වුවද තැන්පතු සහතික භෞතික පරීක්ෂාව අනුව එම අගය රු 500,000 ක් විය.

(ආ) සභාව සතු ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම ගිණුම්වල හෙළිදරව්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම් ගත කිරීම් කර නොතිබුණි.

(ඈ) ගිණුම් විෂයයන් 08 ක් සම්බන්ධයෙන් අවසන් ගිණුමේ දක්වා ඇති අගයන් ඒවාට අදාල උපලේඛන සමඟ සැසඳීමේදි රු 727,845 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු 19,317,232 ක් වූ ගනු දෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 4, 452,599 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 6,640,281 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 ' | රු. 000 ' | රු. 000 ' |
| (i) | වරිපනම් හා බදු | 935 | 738 | 197 |
| (ii) | බදු කුලි | 4,182 | 3,052 | 1,130 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,077 | 214 | 863 |
| (iv) | වෙනත් ආදායම් | 9,779 | 10,563 | - |

**2.2.2. බදු කුලී**

කඩ කාමර 04 ක අදාලව 2012 ජනවාරි 01 දිනට එකතුව රු 76,286 ක් වූ හිඟ කඩ කාමර කුලී විගණිත දිනය වූ 2012 නොවැම්බර් 23 දින වන විටත් අය කර ගෙන නොතිබුණු අතර 2011 සහ 2012 වර්ෂ සඳහා බිල් කිරීම් ද කර නොතිබුණි.

**2.2.3. වෙනත් ආදායම්**

(අ) 2011 දෙසැම්බර් 30 දින අංක 1739 දරන ගැසට් නිවේදනය අනුව සභා බල ප්‍රදේශයේ කරවිට,නිවිතිගල,දැල යන නගර වල කුලියට දීම හා ව්‍යාපාරික කටයුතු සඳහා නවත්වා තබන වාහන වලින් මාසික බද්දක් අය කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා මාසික බද්දක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 පෙබරවාරි 23 දින සභාවේ යෝජනා සම්මත අංක 06 පරිදි ස්ථිර වශයෙන් මාසිකව ගාස්තු අය කරන වාහන වලින් හැර නිවිතිගල නගරය වෙත පිටතින් පැමිණ නතර කරන වාහන වලින් නතර කර තබන කාලය පැයක් සඳහා අයකරන ගාස්තුව අනුව අවම වාර්ෂික ලංසුව රු 20,000 ක ප්‍රමාණයට ටෙන්ඩර් කර ගාස්තු අය කිරීමට යෝජනා කර තිබූ නමුත් අතුරු ව්‍යවස්ථා පනවා එම ගාස්තුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4. උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 2,074,666 |
| (ii) | මුද්දර ගස්තු | 5,618,576 |

**2.3. නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

(අ) 53-5634 දරන කැබ් රථය දීර්ඝ කාලයක් තිස්සේ නිෂ්කාර්යයව පවතින අතර, භෞතික පරික්ෂා කිරිමේදි දොරවල්වල අගුල හා වීදුරු කොටස් ගලවා ඉවත් කර තිබූ අතර

තවදුරටත් නිෂ්කාර්යයව පැවතීම තුලින් එම වාහනය වෙන්දේසි කර ලබා ගැනීමට තිබෙන මූල්‍යමය වටිනාකම අඩු වන බව නිරීක්ෂණය විය.

(ආ) අවු: 3 කට වැඩි කාලයක සිට අක්‍රියව පවතින මහජන බැංකුවේ අංක 192-2610652 96-7 දරන ඉතිරි කිරීමේ ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට රු 13,982 ක ශේෂයක් විය.

**2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**-------------------------------------------------------------**

(අ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන සභපතිතුමා ඇතුළු මන්ත්‍රිවරුන් 12 දෙනෙක් සඳහා රු 175,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදි උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ 2005 ජුනි 08 වන දිනැති අංක 396/18 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ දක්වා ඇති රීති විධිවිධාන වලට පටහැනිව සභා රැස්වීම් වලට සහභාගී නොවූ සභිකයන් 08 දෙනෙක් සඳහා අවස්ථා 10 ක දී රු 50,000 ක් වූ මුදලක් ගෙවා තිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

(අ) 2010 පෙබරවාරි 29 දින කොන්ත්‍රාත් කරුවකුට ගෙවන ලද රු 200,000 ක අත්තිකාරම් විගණිත දිනය වූ 2012 නොවැම්බර් 28 දින දක්වා පියවා නොතිබුණි.

(ආ) අළුත් වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයක් වෙත යොමු කර තිබූ කැබ් රථයක් අවුරුදු 01 කුත් මාස 06 ක් ඉකුත් වි තිබූ නමුත් අළුත් වැඩියාව අවසන් කර ආපසු භාර දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැය විෂයන් 12 කට අදාල රු 5,737,804 ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබූ අතර වැය විෂයයන් 1 1 කට අදාලව රු 1,222,130 ක ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබිණ.

**3. පද්ධති හා පාලන**

**----------------------**

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය